ලෝක දිවි තොර කරගැනීම් වැළැක්වීමේ දිනය - 2022 - "ක්‍රියාවන් තුළින් බලාපොරොත්තු ජනිත කරවමු"

ලෝකය පුරා දළ වශයෙන් පුද්ගලයින් 703,000 ක් වාර්ෂිකව දිවි තොර කරගන්නා බවත්, ඒ සෑම දිවි තොර කරගැනීමකටම දිවි තොර කරගැනීමට උත්සාහ කිරීම් 20 ක් වත් සිදුවන බවත්, එම එක් එක් සෑම උත්සාහයකටම තවත් පුද්ගලයින් ගණනාවක් දිවි තොර කරගැනීමේ නැඹුරුතාවයන්ගෙන් පෙළෙනා බවත් ලෝක සෞඛ්‍ය සංවිධානය පවසයි.

ඒ අනුව, දිවි තොර කරගැනීම් මහජන සෞඛ්‍ය ගැටළුවක් ලෙසින් සලකමින් වාර්තා කිරීම අවශ්‍ය වුවත්, එහිදී ඒ සඳහා හඳුන්වා දී ඇති මාධ්‍ය මාර්ගෝපදේශයන් තිරව පිළිපැදීම අත්‍යවශ්‍ය වන්නේ, එම වාර්තාවන් ඔස්සේ දිවි තොර කරගැනීමේ නැඹුරුතාවයෙන් පෙළෙනා අයවලුන් දිවි තොර කරගැනීමට පෙළැඹීම අවම කර ගැනීමටයි. එහිදී දිවි තොර කරගැනීමේ වාර්තාවන් සමඟින් හදිසි උපකාරක අංක පළ කිරීම වැදගත් වේ.

2021 සහ 2022 වසර තුළ දිනපතා පුවත්පත් අතර සංසන්දනයක් ඔස්සේ, දිවි තොර කරගැනීම් වාර්තා කිරීමේදී හදිසි උපකාර අංක සඳහන් කර නොමැති අවස්ථාවන් ප්‍රමාණය පහත පරිදි දැක්විය හැක.

අද, සැප්තැම්බර් 10, 2022 දින, ලෝක දිවි තොර කරගැනීම් වැළැක්වීමේ දිනයයි. දිවි තොර කරගැනීම් වැළැක්වීම සඳහා සක්‍රිය ලෙසින් දායක වීමට අදිටන් කරගත යුතු දිනය අදයි.

ඒ සඳහා මාධ්‍ය ලෙසින් ලබාදිය යුතු දායකත්වය, ඒ පිළිබඳ මාධ්‍ය අත ඇති සමාජ වගකීම පිළිබඳ නැවත සිතා බැලීමට සුදුසුම දිනය අදයි.

උපකාරක අංකයක් පළ කරමු! ජීවිතයක් රැක ගනිමු!

හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

මූලාශ්‍ර:

https://media.samaritans.org/.../Media_Guidelines_FINAL.pdf

https://www.who.int/cam.../world-suicide-prevention-day/2022
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...